කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව
(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)

පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්‍ෂරතාවය හා තොරතුරු කුසලතා
**LISC – E1015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. පාඨකයාගේ කාලය ආරක්ෂා කළ යුතුය යන ආචාර්ය රංගනාධන්ගේ සිව්වන නීතිය ආරක්ෂා කිරීම උදෙසා ඔබ පුස්තකාලයාධිපතිවරයෙක් ලෙස ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

02. ඕනෑම රටක ආර්ථික සංවර්ධනය රඳී ඇත්තේ බුද්ධිමය සංවර්ධනය මතය. බුද්ධිමය සංවර්ධනය ඇති කරලීමේ කාර්යයේදී මහජන පුස්තකාල සතු භූමිකාව පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. පැරණි ශ්‍රී ලංකාවේ දේශීය දැනුම සංරක්ෂණය කරලීමේ කාර්යයේදී පුස්කොළ ලේඛන කලාවෙන් ලැබී ඇත්තේ සුවිශේෂී දායකත්වයකි. මේ පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

04. සාධිකාරිත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 20)

05. ජොහැන්ස් ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය සොයාගැනීම ලෝකයේ පුස්තකාල සංවර්ධනයට දායක වූ අයුරු පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 20)

06. සාම්ප්‍රදායික පුස්තකාල 21 ශතවර්ෂයේ ද ඉතා සාර්ථක ගමනක නිරත වී සිටින්නේ අන්තර්ජාලය තුළින් සියලු පාඨක තොරතුරු අවශ්‍යතා ඉටුකිරීමට අසමත් වී ඇති බැවිනි. සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   i. කොංග්‍රස් පුස්තකාලය
   ii. සාර සංග්‍රහ
   iii. ප්‍රාථමික මූලාශ්‍ර
   iv. ජාතික කියවීම් මාසය
   v. තොරතුරු සාක්ෂරතාවය (ලකුණු 05x4=20)

***********************************